**29-12-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ දැන් ආපසු නිවසට යා යුතුයි. එබැවින් ඔබගේ සිරුර ඇතුළුව ඔබගේ සියලුම ශාරීරික නෑදෑයින් අමතක කර දමන්න; නිරන්තරයෙන් මා පමණක් සිහි කර, පිවිතුරු වන්න.

**ප්‍රශ්නය:** පිරිපහදු වූ බුද්ධි ඇති අයට පමණක් වටහා ගත හැකි, ජීවාත්මය හා සම්බන්ධ සියුම් කාරණා මොනවාද?

**පිළිතුර:** 1. ජීවාත්මය, ඉඳිකටුවක් මෙන් ක්‍රමයෙන් මළකඩ වලින් වැසී ඇත. එම මළ ඉවත් කළ හැක්කේ සිහි කිරීමේ සිටීමෙන් පමණයි. මළකඩ ඉවත් වූ විට පමණයි, එනම්, ජීවාත්මය, තමෝප්‍රධාන් බවින් සතෝප්‍රධාන් වූ විට පමණයි පරම පියාගේ ආකර්ෂණයක් තිබිය හැකි වන්නේ සහ ජීවාත්මයට ආපසු පියා සමග නිවසට යාමට හැකි වන්නේ. 2. මළකඩ ඉවත් වූ පමණට අනුව ඔබගේ විස්තර කිරීම අන් අයව ආකර්ෂණය කරයි. මේවා, රළු බුද්ධි ඇති අයට වටහා ගැනීමට නොහැකි, ඉතා ගැඹුරු සහ සියුම් කාරණාය.

ඕම් ශාන්ති. පරමාත්ම දෙවියන් පවසයි. ඔබගේ බුද්ධියට ඇතුළු වූයේ කවුරුන්ද? වෙනත් ගීතා පාඨශාලාවලදී 'දෙවියන් පවසයි' යැයි කියූ විට, ඔවුන්ගේ බුද්ධිය තුළ සිටින්නේ ක්‍රිෂ්ණා පමණයි. මෙහි, ඔය දරුවන්, උසස්ම උසස් පියාව සිහි කරයි. මෙකල, මෙය ඔබ වඩාත්ම ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයන් බවට පත් වන සංගම යුගයයි. පරමාත්ම පියා මෙතැන අසුන් ගෙන ඔය දරුවන්ට පවසන්නේ තමන්ගේම ශරීරය ඇතුළුව, සියලුම ශාරීරික නෑදෑකම් බිඳදමා, තමන් ජීවාත්මයක් බව සළකන්න. මෙය බොහෝ සේ අත්‍යාවශ්‍යයි. පරමාත්ම පියා මෙය විස්තර කරන්නේ සංගම යුගයේදී පමණයි. අපවිත්‍ර වන්නේ ජීවාත්මයි. ජීවාත්ම දැන් පිවිතුරු වී ආපසු නිවසට යා යුතුයි. මිනිසුන් පාරිශුද්ධකරුව සිහිකරමින් සිට ඇති නමුත් ඔවුන් ඔහුව හඳුනන්නේ නැත. භාරතයේ ජනයා සිටින්නේ සම්පූර්ණ අන්ධකාරයේය. භක්තිය රාත්‍රිය වන අතර ඥානය දිවා කාලයයි. රාත්‍රියේ අන්ධකාරය තිබෙන අතර දිවාකල ආලෝකය ඇත. ස්වර්ණමය යුගය දිවාකල වන අතර කලි යුගය රාත්‍රියයි. ඔබ දැන් කලි යුගයේ සිටින අතර ඔබ ස්වර්ණමය යුගයට යා යුතුයි. පිවිතුරු ලෝකයේ කිසිවෙක් අපවිත්‍ර වීම පිළිබඳ ප්‍රශ්නයක් නැත. පිවිතුරු වීම පිළිබඳ ප්‍රශ්නය මතු වන්නේ ඔබ අපවිත්‍ර වූ විට පමණයි. ඔබ පිවිතුරු වන විට, ඔබ අපවිත්‍ර ලෝකය සිහි කරන්නේවත් නැත. දැන් ලෝකය අපවිත්‍ර බැවින් ඔබ පිවිතුරු ලෝකය සිහිපත් කරයි. අපවිත්‍ර ලෝකය, චක්‍රයේ දෙවන භාගය වන අතර පිවිතුරු ලෝකය පළමුවන භාගයයි. එහි අපවිත්‍ර කිසිවෙක් සිටිය නොහැක. පිවිතුරුව සිටි අය දැන් අපවිත්‍ර වී ඇත. කතා කෙරෙන උපත් 84 න් කියැවෙන්නේ, ඔවුන් පිළිබඳවයි. මේවා ඉතාමත්ම ගැඹුරු කරුණු වන අතර වටහා ගැනීමට අවශ්‍යයි. ඔබ චක්‍රයෙන් භාගයක්ම භක්තියේ යෙදී සිටි බැවින් ඔබට එතරම් විගසින් එය නවතා දැමිය නොහැක. මනුෂ්‍යයින් සිටින්නේ සම්පූර්ණ අන්ධකාරයේය. කෝටි ප්‍රමාණයකින් මතු වන්නේ අතලොස්සක් පමණයි. මෙම ඥානය කෙනෙකුගේ බුද්ධියේ සනිටුහන් වන්නේ ඉතා කලාතුරකිනි. පරමාත්ම පියා පවසන්නේ ප්‍රධානතම දෙය වන්නේ සියලුම ශාරීරික නෑදෑයන් අමතක කර, නිරතුරුවම මා පමණක් සිහිපත් කිරීමය. ජීවාත්ම, අපවිත්‍ර වී ඇති අතර පිවිතුරු විය යුතුයි. පරම පියා පමණයි මෙම විස්තර කිරීම ලබා දෙන්නේ මන්ද, මෙම පියා, අධ්‍යක්ෂක, රන්කරු, වෛද්‍යවරයා, නීතිඥයා මෙන්ම සෑම දෙයක්මය. මෙම නම් එහි නොපවතී. මෙම ඉගෙනුම පවා එහි නොතිබෙයි. මිනිසුන් මෙහි ඉගෙන ගන්නේ රැකියාවක් ලබා ගැනීමටයි. පෙර කල ස්ත්‍රීන් එතරම් ඉගෙනගත්තේ නැත. ඔවුන් මේ සියල්ලක්ම ඉගෙනගත්තේ පසු කාලයන්හිදී. ස්වාමියා මිය ගියේ නම්, නිවෙස බලාගන්නේ කවුද? ස්ත්‍රීන් සෑම දෙයක්ම ඉගෙනගන්නේ මේ නිසාය. ඔබගේ සිත කණස්සල්ලට පත් කිරීමට මෙවන් දේවල් ස්වර්ණමය යුගයේ පවතින්නේ නැත. මෙහි, ඔවුන් එවන් කලකට මුදල් ඉතිරිකරයි. එහිදී ඔබගේ හිතට පීඩා ගෙනෙන එවන් සිතිවිලි ඇති වන්නේ නැත. පරමාත්ම පියා ඔය දරුවන්ව බොහෝ ධනවත් කරවයි. දිව්‍යලෝකයේ ඔබට බොහෝ සම්පත් ඇත. දියමන්ති සහ මැණික් ආකර සියල්ලක්ම පිටාර ගලයි. මෙහි භූමිය නිසරු වී ඇති අතර එහි කිසි ශක්තියක් නැත. එහි ඇති මල් සහ මෙහි තිබෙන මල් අතර දිවා රාත්‍රිය මෙන් වෙනසක් ඇත. මෙහි සෑම දේකම ඇති සියලුම බලය අවසන්ව ගොසින්ය. ඔවුන් ඇමරිකාව ආදියෙන් බීජ ආනයනය කරන නමුත් ඒ කිසිවකට කිසිම ශක්තියක් නැත. භූමිය කෙසේදයත් ඔබ බොහෝ උත්සාහ දැරිය යුතුයි. එහි සෑම දෙයක්ම සතෝප්‍රධාන්ය. පදාර්ථ සතෝප්‍රධාන් බැවින් සෑම දෙයක්ම සතෝප්‍රධාන්ය. මෙහි ඇති සෑම දෙයක්ම තමෝප්‍රධාන්ය. කිසිම දෙයක කිසි ශක්තියක් ඉතිරිව නැත. මෙම

වෙනස වැටහෙන්නේ ඔබට පමණයි. දැන් ඔබට සතෝප්‍රධාන් දේවල් දැකිය හැක්කේ ධ්‍යානයකට සම වැදුනු විට පමණයි. එහි මල් බොහෝ අලංකාරයි. ඔවුන්ට එහි තිබෙන ධාන්‍ය ඔබට දැක ගැනීමේ හැකියාව තිබෙන්නට පුළුවනි. ඔබගේ බුද්ධියෙන් ඔබට වටහා ගත හැක. එහි සෑම දේකටම බොහෝ බලය තිබේ. කිසිම කෙනෙකුගේ බුද්ධියට නව ලෝකය ඇතුළු වන්නේ නැත. මෙම පැරණි ලෝකය ගැන අසන්නටවත් එපා! සියලුම මනුෂ්‍යයින්ව සම්පූර්ණ අන්ධකාරයේ නින්දට දමා ඇති එවන් බොරු කතා පුවත් පවසා තිබේ. ඉතිරිව ඇත්තේ ඉතාමත්ම ටික කාලයක් පමණක් බව ඔබ ඔවුන්ට පැවසූ විට, ඔවුන් ඔබට සිනහසෙයි. සැබවින්ම තමන් බ්‍රහ්මින්වරුන් බව සලකන අය පමණක් මෙම දේවල් වටහා ගනී. මෙය අළුත් භාෂාවකි, ආධ්‍යාත්මික ඉගෙනුමකි, ආධ්‍යාත්මික පියා පැමිණෙන තුරු, කිසිවෙකුට කිසි දෙයක් වටහා ගත නොහැක. ඔය දරුවන් ආධ්‍යාත්මික පියාව හඳුනනවා. ඒ මිනිසුන් යෝගාව ආදිය උගන්වන නමුත් ඔවුන්ට එය ඉගැන්වූයේ කවුද? ආධ්‍යාත්මික පියා ඔවුන්ට ඉගැන්වූ බව කිව නොහැක. පරමාත්ම පියා උගන්වන්නේ ඔය ආධ්‍යාත්මික දරුවන්ට පමණයි. සංගම යුගයට අයත් වන බ්‍රහ්මණයින්ට පමණයි මෙය වැටහෙන්නේ. ආදි සනාතන දෙවි දේවතා ධර්මයට අයත් අය පමණයි බ්‍රහ්මණයන් වන්නේ. ඔය බ්‍රහ්මණයින් සිටින්නේ ඉතාමත්ම ටික දෙනෙකි! ලෝකයේ බොහෝ විවිධ කුල සහ වංශ ආදිය ඇත. මුළු ලෝකයේම ආගම් කොපමණක්, භාෂා කොපමණක් තිබේද කියා ඔබට සොයාගත හැකි පොතක් නිසැකයෙන්ම ඇති. ඒ කිසිවක් ඉතිරි නොවන බව ඔබ දන්නවා. ස්වර්ණමය යුගයේ තිබුණේ එක් ආගමක් සහ එක් භාෂාවකි. ඔබ දැන් ලෝක චක්‍රය දන්නවා. මෙම භාෂා එකක්වත් ඉතිරි නොවන බවද ඔබට වැටහෙයි. සෑම කෙනෙක්ම සාම දේශයට යයි. ඔය දරුවන්ට දැන් ලෝක චක්‍රයේ ඥානය ලැබී ඇත. ඔබ මිනිසුන්ට විස්තර කර දුන්නත් ඔවුන්ට මෙය නොවැටහෙයි. ඔබ විවෘත කිරීම්, වැදගත් මිනිසුන් ලවා සිදු කරයි, මන්ද ඔවුන් බොහෝ ප්‍රසිද්ධ බැවින් හඬ පැතිරී යනු ඇත විශ්මිතයි! විවෘත කිරීම ජනාධිපති හෝ අගමැති අතින් සිදු විය. මේ බාබා එය සිදු කළේ නම්, විවෘත කිරීම සිදු කළේ පරමාත්ම පියා, පරමාත්ම ජීවය බව මිනිසුන් විශ්වාස නොකරයි. කොමසාරිස් සහ වෙනත් අය මෙහි පැමිණෙන විට, ඔවුන් පසුපස වෙනත් අය දිව එයි. කිසි කෙනෙක් මෙම කෙනා පසුපස දිව එන්නේ නැත. දැන් ඔය බ්‍රහමින් දරුවන් සිටින්නේ ඉතාමත්ම ටික දෙනෙකි. ඔබගෙන් වැඩි දෙනෙක් සිටින විට පමණයි, ඔවුන් වටහා ගන්නේ. ඔවුන් දැන් මෙය වටහාගන්නේ නම්, ඔවුන් පියා වෙතට දිව එනු ඇත. කෙනෙක් එක් දියණියකට මෙසේ පැවසුවා අපට ඍජුවම ඔබට ඉගැන්වූ කෙනා ළඟට යැමට අවශ්‍යයි. කෙසේවෙතත්, ඉඳිකටුවක මල බැඳී ඇත්නම්, කාන්දමක් එය ඇද ගන්නේ කෙසේද? කාන්දමට, ඉඳිකටුව ඇද ගත හැකි වන්නේ මලකඩ ඉවත් කළ විට පමණයි. ඉඳිකටුවේ සුළු කොටසක් හෝ මලකඩ වලින් වැසී තිබේ නම්, එයට එතරම් ඇද ගැනීමට නොහැකි වෙයි. අවසානයේදී පමණයි සියලුම මලකඩ සම්පූර්ණයෙන්ම ඉවත් වී, ඔබ එසේ වන්නේ. එවිට ඔබ පියා සමග ආපසු නිවසට යයි. ඔබ දැන් සැලකිලිමත් වන්නේ ඔබ තමෝප්‍රධාන් වී, මලකඩ වලින් වැසී සිටීම ගැනයි. ඔබ වැඩියෙන් සිහිපත් කිරීමේ සිටින ප්‍රමාණයට අනුව, වැඩියෙන් මලකඩ ඉවත් වෙයි. මලකඩ ක්‍රම ක්‍රමයෙන් එකතු වූ ආකාරයෙන්ම, එය ක්‍රමයෙන් දිගටම ඉවත් වෙයි. එය ඒ අන්දමින්ම ඉවත් වෙයි. මලකඩ එකතු වී ඇති ආකාරයෙන්ම එය ඉවත් කිරීමද සිදුවිය යුතුයි, ඒ සඳහා ඔබ පරම පියාව සිහිපත් කළ යුතුයි. සමහර මිනිසුන්ගේ මලකඩ, සිහිපත් කිරීමේ සිටීමෙන් බොහෝ සේ ඉවත් වී ඇති අතර, තවත් අයගේ එය ඉවත් වී ඇත්තේ සුළුවෙනි. කෙනෙකුගේ මලකඩ වැඩියෙන් ඉවත් වී ඇති පමණට, ඔහුගේ විස්තර කිරීම් වලින් ඔහුට වැඩියෙන් අන් අයව ඇද ගැනීමට හැකි වෙයි. මේවා ඉතාමත්ම සියුම් කාරණාය. රළු බුද්ධි ඇති අයට මෙම දේවල් වටහා ගත නොහැක. රාජධානියක් ස්ථාපිත වන බව ඔබ දන්නවා. ඔබට වෙනත් අයට විස්තර කිරීමට, බොහෝ විවිධ ක්‍රම දිනෙන් දින මතු වනවා. ඔබට ප්‍රදර්ශන, කලාගාර ආදිය තිබෙයි කියා ඔබ පෙර දැන සිටියේ නැත. ඔබ තව තව දියුණු වත්ම තවත් දේවල් තිබෙන්නට පුළුවනි. ස්ථාපනය සිදු වීමට පෙර, දැන් තවමත් කාලයක් ඉතිරිව තිබේ. ඔබ අධෛර්යයට පත් නොවිය යුතුයි. ඔබගේ භෞතික ඉන්ද්‍රියන් පාලනය කිරීමට ඔබට නොහැකි නම්, ඔබ ඇද වැටෙයි. ඔබ පාපයට ඇද වැටෙන්නේ නම්, ඉඳිකටුවේ බොහෝ මල බැඳෙනු ඇත. පාපයන් තුළින් බොහෝ මලකඩ බැඳී ඇත. ස්වර්ණමය සහ රිදී යුගයන්හිදී, එකතු වන්නේ ඉතාමත්ම සුළු මලකඩ ප්‍රමාණයකි, ඉන්පසුව චක්‍රයෙන් භාගයකට පසුව එය විගසින් එකතු වෙයි. මෙසේ කියැවෙන්නේ, ඔබ පහළට ඇද වැටෙන නිසාය දේවතා ධර්මය අතුරුදහන්ව ගොසින්ය, නමුත් එහි සලකුණු තවමත් පවතී. හොඳම සලකුණ වන්නේ මෙම පිංතූරයයි. ඔබට ලක්ෂ්මී සහ නාරායන්ගේ මෙම පිංතූරය, ඔබත් සමග රැගෙන යා හැක, මන්ද ඔබ එය බවට පත්වන බැවින්. රාවණගේ රාජධානිය විනාශ කෙරෙන අතර රාමාගේ රාජධානිය ස්ථාපිත කෙරෙනවා. මෙය රාමාගේ රාජධානිය වන අතර එය රාවණගේ රාජධානියයි මෙය සංගම යුගයයි. බොහෝ කරුණු තිබේ. වෛද්‍යවරුන් ඔවුන්ගේ බුද්ධිය තුළ බොහෝ විවිධ වර්ග වල ඖෂධ තබා ගනී. නීතිඥයෙකුගේ බුද්ධියේ බොහෝ විවිධ

කරුණු ඇත. බොහෝ විවිධ මාතෘකා ගැන ඉතා හොඳ පොතක් ලිවිය හැක. එවිට ඔබ දේශනයක් පැවැත්වීමට යන විට, ඔබට කරුණු ටිකක් බලාගත හැක. තියුණු බුද්ධි ඇති අය විගසින් ඒවා කියවනු ඇත. පළමුවෙන්ම ඔබ විස්තර කිරීමට යන දේ සටහන් කළ යුතුයි. ඇතැම් විට දේශනය දීමෙන් පසුව ඔබට එම කරුණු සිහි වෙයි 'මා මේ දේ විස්තර කළා නම් වඩා හොඳයි.' මෙම කරුණු අන් අයට විස්තර කිරීමෙන් ඒවා ඔබගේ බුද්ධියේද සනිටුහන් වනු ඇත. මාතෘකා ලැයිස්තුවක් සාදාගත යුතුයි. ඔබ මාතෘකාවක් තෝරාගෙන තමන් තුළ, දේශනයක් පිළියෙල කර ගත යුතුයි, එසේ නැතහොත් එය ලියා, ඉන්පසුව ඔබට සියලුම කරුණු ලිවීමට හැකි වුවාද කියා පරීක්ෂා කර බලන්න. ඔබ මේ සඳහා වැඩියෙන් සූදානම් වන තරමට, එය වඩා හොඳ වෙයි. අහවල් කෙනා හොඳ ශල්‍යවෛද්‍යවරයෙක් බවත් ඔහුගේ බුද්ධියේ බොහෝ කරුණු ඇති බවත්, පියාට වැටහෙයි. ඔබ තමන්ව පුරවාගෙන මෙහි සිට යන්නේ නම්, සේවය නොකර ඔබට ආශ්වාදයක් නොලැබෙනු ඇත. ඔබ ප්‍රදර්ශන පවත්වන විට, මිනිසුන් දෙදෙනෙක් හෝ හතර දෙනෙක් හෝ හයක් හෝ අට දෙනෙක් ඇතැම් විට මතුවෙයි. සමහර විට එක්කෙනෙක්වත් මතු නොවන්නේය. දහස් ගණනින් ප්‍රදර්ශනය නරඹන නමුත් ඉන් මතු වන්නේ ඉතාමත්ම ටික දෙනෙකි. මේ නිසයි ඔබ දැන් බොහෝ විශාල පිංතූර නිර්මාණය කරන්නේ. ඔබ එන්න එන්නම දක්ෂ වනවා. එමෙන්ම වැදගත් මිනිසුන්ගේ තත්ත්වය කුමක්ද කියා ඔබට බලාගත හැක. ඔබ මෙම ඥානය ලබා දිය යුත්තේ කාටද කියා ඔබ සොයා බැලිය යුතු බව, බාබා විස්තර කර ඇත. ඔබ, මගේ බැතිමතුන් වන අයගේ නාඩි පරීක්ෂා කර බැලිය යුතුයි. ගීතාව හදාරන අයට එක් ප්‍රධාන දෙයක් විස්තර කර දෙන්න දෙවියන් යැයි කියන්නේ එක් උසස්ම උසස් කෙනාට පමණයි. ඔහු අශාරීරිකයි. කිසිම ශාරීරික ජීවයකට පරමාත්ම දෙවියන් යැයි කිව නොහැක. ඔය දරුවන්ට දැන් සම්පූර්ණ වැටහීම ලැබී තිබේ. සන්‍යාසීන් තම නිවෙස් හැර දමා පලා යයි. සමහරුන් තවමත් බ්‍රහ්මචාරීව සිටින ළමා වියේදී පලා යයි. ඔවුන්ගේ මතු භවයේද එසේම වෙයි ඔවුන් අනිවාර්යයෙන්ම මව් කුසකින් උපත ලබයි. ඔවුන් විවාහ වන තුරු බන්දන වලින් නිදහස් බැවින්, තම නෑදැයින් ආදිය එතරම් සිහි කරන්නේ නැත. ඔවුන් විවාහ වී ඇති විට ඔවුන්ගේ සියලුම නෑදැයින්ව සිහි වෙයි. එයට කල්ගත වෙයි ඔවුන්ට එතරම් විගසින් බන්දන වලින් නිදහස් වීමට නොහැක. සෑම කෙනෙක්ම තමන්ගේම ජීවිත කතාව දන්නවා. ඔවුන්ද පෙර ගෘහවාසීන් ලෙස සිටි බවත් පසුව අත්හැරීමේ මාර්ගයට පිවිසි බව, සන්‍යාසීන්ට වැටහෙයි. ඔබගේ අතහැරීම වඩා ශ්‍රේෂ්ඨයි, එයට උත්සාහයක් අවශ්‍ය වන්නේ ඒ නිසාය. එම සන්‍යාසීන් තම සිරුරේ අළු ගා, හිස මුඩු කර, ඔවුන්ගේ ඇඳුමේ ස්වරූපය වෙනස් කරයි. ඔබට එවැනි කිසිවක් කිරීමට අවශ්‍ය නැත. මෙහි ඔබගේ ඇඳුම වෙනස් කිරීම ගැන ප්‍රශ්නයක් නැත. ඔබ සුදු සාරියක් නොඇන්දාට කමක් නැත. මෙම ඥානය බුද්ධියටයි. 'මා ජීවාත්මයක් වන අතර මා පරමාත්ම පියාව සිහි කළ යුතුයි. මලකඩ ඉවත් වී මා සතෝප්‍රධාන් වන්නේ මෙය තුළිනි.' සෑම කෙනෙක්ම ආපසු නිවසට යා යුතුයි. ඇතමුන් යෝගා බලයෙන් පිවිතුරු වන අතර, ඇතැම් අය ආපසු යාමට පෙර දඬුවම් විඳියි. ඔය දරුවන් මලකඩ ඉවත් කිරීමට උත්සාහ දැරිය යුතුයි, යෝගා ගින්න සිහි කෙරෙන්නේ මේ නිසාය. පාපයන් ගින්නෙන් පිළිස්සී යයි. ඉන්පසුව ඔබ පිවිතුරු වෙයි. රාගයේ කොතටත් ගින්නක් යැයි කියයි. රාග ගින්නේ දැවීමෙන් ඔබ සම්පූර්ණයෙන්ම අවලස්සණ වී ඇත. පරමාත්ම පියා පවසන්නේ දැන් ලස්සණ වන්න! ඔය බ්‍රහ්මණයින්ගේ හැර, වෙනත් කිසිවෙකුගේ බුද්ධියේ මෙම දේවල් සනිටුහන් වන්නේ නැත. මේවා අසහාය දේවල්ය. ඔබ ආගමික ග්‍රන්ථ විශ්වාස නොකරන බවත් ඔබ අදේවවාදීන් වී ඇති බවත් මිනිසුන් ඔබට කියන විට, ඔවුන්ට මෙසේ පවසන්න අපි පෙර ආගමික ග්‍රන්ථ හැදෑරූ නමුත්, පරමාත්ම පියා අපට දැන් මෙම ඥානය ලබා දී තිබේ. විමුක්තිය ලැබෙන්නේ ඥානය තුළින්ය. පරමාත්ම දෙවියන් පවසයි වේදයන් හා උපනිශාද හැදෑරීමෙන්, දන් දීමෙන් හෝ පුණ්‍ය කර්ම සිදු කිරීමෙන් කිසිවෙකුට මා ලබා ගත නොහැක. ඔබට මා ලබා ගත හැක්කේ, මා තුළින්ම පමණයි. පැමිණ, ඔබව වටිනා බවට පත් කරවන්නේ, පරමාත්ම පියා පමණයි. ජීවාත්මයක මල බැඳුනු විට, පැමිණ ඔහුව පිවිතුරු කරන්නට කියා, ඔහු පියාට අඬගසයි. තමෝප්‍රධාන් වී ඇති ජීවාත්ම, දැන් සතෝප්‍රධාන් විය යුතුයි. තමෝප්‍රධාන් වීමෙන්, ජීවාත්ම, තමෝ, රජෝ, සතෝ සහ ඉන්පසුව සතෝප්‍රධාන් විය යුතුයි. අතරමඟදී යම් වරදක් සිදුවන්නේ නම්, තව වැඩිපුර මලකඩ එකතුවෙයි. පරමාත්ම පියා අපව බොහෝ ශ්‍රේෂ්ඨ කරවනවා. එබැවින් එම සතුට තිබිය යුතුයි. මිනිසුන් ඉගෙනගැනීමට විශාල සතුටකින් විදේශගත වෙයි. ඔබ දැන් බොහෝ නුවණ ඇත්තන් බවට පත්වනවා. කලි යුගයේ ඔබ බොහෝ තමෝප්‍රධාන් සහ නුවණ නොමැති අය බවට පත් වී ඇත. ඔබට වැඩියෙන් සෙනෙහස තිබෙන තරමට ඔවුන් ඔබට වැඩියෙන් විරුද්ධ වෙයි. ඔබගේ රාජධානිය ස්ථාපනය කෙරෙන බව, ඔය දරුවන්ට වැටහෙයි. හොඳින් ඉගෙනගෙන, සිහිපත් කිරීමේ සිටින අය, හොඳ තත්ත්වයක් ලබයි. අංකුරය, භාරතයේ පැල කෙරෙමින් තිබෙනවා. දිනෙන් දින, පුවත්පත් මඟින් ඔබගේ නම කීර්තිමත් කෙරෙනවා. පුවත්පත් සෑම තැනකටම යැවෙයි. එම මාධ්‍යවේදීන්ම විටෙක හොඳ දේවල්ද, විටෙක නරක දේවල්ද ලියයි,

මන්ද ඔවුන් විශ්වාස කරන්නේ අසන දේ නිසා. කෙනෙක් ඔවුන්ට කියන ඕනෑම දෙයක්, ඔවුන් පල කරයි. බොහෝ දෙනෙක් ඔවුන් අසන දේ මත, විශ්වාස තබයි. එයට කියන්නේ අන් අයගේ උපදෙස් පිළිපැදීම කියාය. අන් අයගේ උපදෙස් රකුසු උපදෙස්ය. ශ්‍රේෂ්ඨ උපදෙස් ලබා දෙන්නේ පරමාත්ම පියාය. යමෙක් ඔවුන්ට වැරදි යමක් කියූ විට, ඔවුන් පැමිණීම නතර කරයි. සේවයේ නියැලී සිටින අයගේ අවධානයේ සෑම දෙයක්ම ඇත. ඔබ මෙහි කුමන සේවයක් කළත්, ඔබගේ අංක එකේ සේවය එයයි. ඔබ මෙහිදී සේවය කරන අතර, එහි ඵලය එහිදී ලැබෙයි. ඔබ මෙහි කරන සෑම දෙයක්ම කරන්නේ පරම පියා සමගයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ජීවාත්ම ඉදිකටුවේ මළකඩ බැඳී තිබේ. යෝගා බලයෙන් මළකඩ ඉවත් කර, සතෝප්‍රධාන් වීමට උත්සාහ දරන්න. ඔබට අන් අය පවසන දේ අසා, කිසිම විටෙක ඉගෙනීම නවතා දමන්න එපා.
2. ඔබගේ බුද්ධිය, ඥානයේ කරුණු වලින් පුරවා තබාගෙන සේවය කරන්න. ඔවුන්ගේ නාඩි පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඥානය ලබා දෙන්න. ඉතාමත්ම තියුණු බුද්ධියක් ඇති අයෙක් වන්න.

**වරදානය:** මේ කලි යුග ලෝකයේ දුක සහ අසාමයේ දර්ශන දකින අතරතුර, අසීමිත නිරාශාවෙන් යුත්, නොබැඳි නිරීක්ෂකයෙකු වීමට ඔබට හැකි වේවා.
මේ කලි යුග ලෝකයේ කුමක් සිදු වුවද, ඔබ නිරන්තරයෙන් ඉහළ නඟින අවධියේ සිටී. ලෝකයට, දුක්ඛිත කෑගැසීම් ඇත, නමුත් ඔබට ජයග්‍රහණයේ ජයඝෝෂා ඇත. ඔබ කලින් සූදානම් වී ඇති නිසා කිසිදු තත්ත්වයකට බිය නොවේ. ඔබ සියලු වර්ග වල ක්‍රීඩා නොබැඳි නිරීක්ෂකයින් ලෙස දකී. යමෙකු අඬන්නේ හෝ හයියෙන් කෑගසන්නේ නම්, නොබැඳි නිරීක්ෂකයෙකු ලෙස නිරීක්ෂණය කිරීමෙන් සතුටක් ලැබේ. මෙම යකඩ යුග ලෝකයේ දුක සහ අසාමයේ දර්ශන නොබැඳි නිරීක්ෂකයින් ලෙස නිරීක්ෂණය කරන අය, පහසුවෙන් අසීමිත නිරාශාවක් ඇති අය බවට පත් වේ.

**පාඨය:** ඔබට කුමන ආකාරයේ භූමියක් සකස් කිරීමට අවශ්‍යද, එයට වචන වලින් සේවය කරනවාට අමතරව, ඔබේ ආකල්පය තුළින්ද සේවය කරන්න.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: දැන් සම්පූර්ණ හා කර්මාතීත් වීමේ ගැඹුරු සැලකිල්ල ඇති කරගන්න.**

යන්ත්‍රයක් සැකසූ පසු, එය ස්වයංක්‍රීයව දිගටම ක්‍රියා කරයි. එලෙසම, ඔබේ සිතිවිලි, වචන සහ ක්‍රියා ස්වයංක්‍රීයවම දිගටම සැකැස්මට අනුව සිදුවන පරිද්දෙන්, ඔබේ සම්පූර්ණ හා පරිසමාප්ත අවධිය, පරමාත්ම පියාගේ අවධියට සමාන අවධිය, එනම්, කර්මාතීත් අවධිය සකස් කර ගන්න.